G-10

## II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) 1. පුරාණ ගිවිසුමට අයත් ඉතිහාස පොත් ගණන කීයද?
2. බැබිලෝනිය විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ ප්‍රතිස්ථානය පිළිබඳව සඳහන් වන ඉතිහාස ෙ දෙක නම් කරන්න.
3. දේව වචනයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.
4. පුරාණ ගිවිසුමට හා නව ගිවිසුමට අයත් එළිදරව්ව සාහිත්‍යයේ කෘති නම් කරන්න.
5. ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා හා අපෝස්තුළුවරුන්ගේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා නම් කරන්න.
6. පේදුරුතුමාගේ මහා ප්‍රකාශනය ලියා දක්වන්න.
7. ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ කළ වහල් සේවාවන් දෙකක් ලියන්න.
8. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් නම් කරන්න.
9. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පව් දෙකක් දක්වන්න.
10. මහ බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ සිදුකළ විශේෂ කාර්යයන් දෙකක් ලියන්න.

02) 1. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ හතරක් නම් කරන්න.
2. ප්‍රඥාවේ ප්‍රභේද තුනක් දක්වන්න.
3. "ප්‍රඥාව ශුද්ධාත්ම දීමනාවකි." එහෙයින් ප්‍රඥාව ඉල්ලා ශුද්ධාත්මයාණන්ට යාච්ඤාවක් පිළියෙල කරන්න. (පේළි 8)

03) 1. ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගත්පසු මුහුණ දුන් විනිශ්චයන් දෙකක් ලියන්න.
2. ජේසුස් වහන්සේ උත්ථානයෙන් පසු දර්ශනය වූ අවස්ථා තුනක් දක්වන්න.
3. නව අහස හා නව පොළවට ඇතුළු වීමට සුදුස්සකු වීමට ඔබ කරන ක්‍රියා පහක් දක්වන්න.

04) 1. ශු. පාවුළුතුමාගේ ජීවිතයේ අවසානය කෙසේ සිදුවීද?
2. ආරූඪ කර්තෘත්වයට අයත් පාවුළු සංදේශ තුනක් නම් කරන්න.
3. ශු. පාවුළුතුමා සභාවේ වර්ධනයට (පැතිර යාමට) දායක වූ ආකාර පහක් ලියන්න.

05) 1. ශුද්ධවූ සභාවේ ආරම්භක දිනය හා ස්ථානය දක්වන්න.
2. බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි පැවිදි නිකායයන් තුනක් දක්වන්න.
3. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය." යනුවෙන් ජුසේවාස් පියතුමාගේ අවසන් ඔවදනින් ඔබගේ ජීවිතයට ලැබෙන මඟපෙන්වීම් පහක් ලියන්න.

06) 1. එළිදරව්ව සාහිත්‍ය තුළ සංකේත භාවිතයේ පරමාර්ථ දෙක දක්වන්න.
2. එළිදරව්ව සාහිත්‍යය තුළ යොදාගෙන ඇති වර්ණ සංකේත තුනක් දක්වා ඒවායේ අරුත ලියන්න.
3. පීඩන සමයේ කිතු දහම රැකගැනීමට ජුසේවාස් පියතුමා ගත් උත්සාහය අගයමින් පේළි 10 ක පමණ විස්තරයක් කරන්න.

07) 1. පාස්කු අභිරහස යනු කුමක්ද?
2. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග තුනක් දක්වන්න.
3. නව ගිවිසුමේ පාස්කු භෝජනය වන දිව්‍ය යාගයට අර්ථවත් ව සහභාගී විය හැකි ක්‍රම පහක් ලියන්න.

08) කැමති මාතෘකා දෙකක් තෝරාගෙන පේළි 10 බැගින් විස්තර කරන්න.
1. පුරාණ ගිවිසුමේ පූද පූජා
2. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා
3. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතුදහම
4. ශුද්ධවූ පේදුරු තුමා
5. නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යය